1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය යටතේ අය කරනු ලබන මුද්දර ගාස්තු බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවලට පැවරීම සඳහා හා 2008 අංක 05 දරණ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත මූල්‍යාධාර පැවරීම සඳහා වූ ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා විවිධිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 185 (2) (ඇ) වගන්තියට, 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 158 (2) (ආ) වගන්තියට හා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 129(2) (ආ) වගන්තියට අනනුකූල වූවකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬු නාමය**

(01). මෙම ප්‍රඥප්තිය 2010 අංක .04. දරණ බස්නාහිර පළාතේ මුද්දර ගාස්තු පැවරීම සඳහා වූ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ දින සිට ක්‍රියාත්මක වන්නේය.

**මුද්දර ගාස්තු පැවරීම**

(02). වරින් වර සංශෝධිත 1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය යටතේ පළාත් සභාව විසින් පනවා අය කරනු ලැබූ බස්නාහිර පළාතේ පළාත් සභාවේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාව තුළ පිහිටි යම් නිශ්චල දේපලක් පැවරීම සඳහා වූ යම් මුද්දර ගාස්තුවක්, එම අය කරනු ලැබූ මුද්දර ගාස්තුවට අදාළ නිශ්චල දේපල පිහිටි බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයට, එම පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විසින් පූර්වෝක්ත පරිදි මුද්දර ගාස්තු අය කරනු ලැබූ වර්ෂයේ දෙසැම්බර් 31 දින සිට වසර තුනක් ඇතුළත ප්‍රධාන ලේකම්වරයා වෙත කරනු ලබන ලිඛිත හිමිකම්පෑමක් මත එම මුද්දර ගාස්තු ප්‍රමාණය පළාත් සභා අරමුදලින් පවරා දිය හැක්කේය.

(03). මෙම ප්‍රඥප්තියේ පූර්වයෙන් වූ විධිවිධානවල කුමක් සඳහන් වුවද 2005 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වූ එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් අය කරනු ලැබූ මුද්දර ගාස්තු 2013.12.31 දිනට පෙර පළාත් පාලන ආයතනයේ පරිපාලන නිලධාරියා විසින් ප්‍රධාන ලේකම් වෙත ලිඛිත හිමිකම්පෑමක් මත එම මුද්දර ගාස්තු ප්‍රමාණය පළාත් සභා අරමුදලින් පවරා දිය හැක්කේය.

**රෙජිස්ට්‍රාර් ජනරාල් සහතිකය**

(04). රෙජිස්ට්‍රාර් ජනරාල් හෝ ඔහු වෙනුවෙන් මෙම කාර්යය සඳහා ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නිලධාරියෙකු විසින් සහතික කරන ලද මුද්දර ගාස්තු ගෙවීමට අදාළ ලේඛනයක් සමඟ හිමිකම්පෑමක් ඉදිරිපත් කර ඇත්නම් මිස ඉහත 2 හා 3 වගන්තිවල සඳහන් හිමිකම්පෑම වලංගු නොවන්නේය.

දිනය
2010.04.07

(05). ඉහත (02) සහ (03) වගන්ති යටතේ පවරා දෙන මුද්දර ගාස්තු ප්‍රමාණය, 2008 අංක 05 දරණ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත මූල්‍යාධාර සැපයීම සඳහා වූ ප්‍රඥප්තියෙහි 4 (4) උප වගන්තියේ (අ), (ආ) අනු වගන්ති යටතේ තීරණය කර පළාත් පාලන ආයතන සඳහා ලබා දෙන ලද මූල්‍යාධාර ප්‍රමාණය අඩු කිරීමෙන් පසුව ඉතිරි වන මුදල විය යුතුය.

පෙර ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම.

(06). මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට 2008 අංක 05 දරණ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත මූල්‍යාධාර සැපයීම සඳහා වූ ප්‍රඥප්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

අර්ථ නිරූපනය

(07). පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියෙහි :-

"ප්‍රධාන ලේකම්" යන්නෙන් බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් නිලය දරන තැනැත්තා අදහස් වේ.

"රෙජිස්ට්‍රාර් ජනරාල්" යන්නෙන් රජයේ ඉඩම් විෂයයට අදාළ රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර දරන තැනැත්තා අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාත් සභාව අදහස් වේ.

"ප්‍රධාන පරිපාලන නිලධාරියා" යන්නෙන් මහ නගර සභාවක් සම්බන්ධයෙන් වන විට මහ නගර සභාවේ නාගරික කොමසාරිස් ද නගර සභාවක් සහ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වන විට නගර සභාවේ/ප්‍රාදේශීය සභාවේ ලේකම් ද අදහස් වේ.

"පළාත් පාලන ආයතන" යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියක් හෝ නීතියක් යටතේ හෝ පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

(08). මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.